# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2341/64 - 2023 ජූලි මස 21 වැනි සිකුරාදා - 2023.07.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**රේගු නිවේදනයයි**

ආදායම් සංරක්ෂණ ආඥාව - අංක 04/2023

**1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත**

*ආඥාව*

1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති වැඩ බලන අමාත්‍ය ෂෙහාන් සේමසිංහ වන මම, (235 වැනි අධිකාරය) වන රේගු ආඥාපනතේ "අ" උපලේඛනයේ විධිවිධාන යටතේ වූ 2023 මාර්තු මස 24 දිනැති අංක 2324/49 දරන *අති විශෙෂ ගැසට්* නිවේදනයේ ඇමුණුම I හි අනුග්‍රහ ලැයිස්තුව (ආනයන) සඳහා, මෙහි වූ අංක 5 වශයෙන් සඳහන් නව අයිතමය, 2023 ජූලි මස 22 වැනි දින සිට ඇතුළත් කිරීමට මෙම ආඥාව මගින් නියම කරමි.

| *අයිතමය (1)* | *විස්තරය (2)* | *තීරු ගාස්තු ප්‍රමාණය (3)* |
|---|---|---|
| 05. | මුද්‍රණ තීන්ත නිෂ්පාදන කාර්යය සඳහා ලියාපදිංචි මුද්‍රණ තීන්ත නිෂ්පාදකයන් විසින් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 3903.90.10 යටතේ වර්ගීකරණය වන ජලමූල සමජාතීය අවයවික (හෝමෝ පොලිමර්) සහ බහුඅවයවික (කොපොලිමර්) සහ 3906.90.10 යටතේ වර්ගීකරණය වන ජලමූල ඇක්‍රිලික් සමජාතීය අවයවික (හෝමෝ පොලිමර්) සහ බහුඅවයවික (කොපොලිමර්) ආනයනය කිරීම, කර්මාන්ත විෂයභාර අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය මත, සහ රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියට යටත්ව | 5% |

**ෂෙහාන් සේමසිංහ.**
*වැ.බ.* මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2023 ජූලි මස 21 වැනි දින,
කොළඹ 01,
මුදල් ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.


1A - PG 6408— 431 (2023/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**නිවැරදි කිරීමයි**

(235 වැනි අධිකාරය වූ) රේගු ආඥාපනතේ 107 අ වගන්තිය යටතේ ප්‍රකාශයට පත්කර ඇති 2023 අප්‍රේල් මස 28 දිනැති අංක 2329/46 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* නියෝග අංක 3 යටතේ "අංක 972/17 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ*" යනුවෙන් සඳහන්ව ඇත. එය "අංක 792/17 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ*" ලෙස නිවැරදි විය යුතු බව මෙයින් නිවේදනය කරමි.

EOG 07-0229